සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)**
**Year End Evaluation - 2023 (2024)**

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................................

## I කොටස

අංක 1 - 10 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජුවාම් සුබාරංචියට අදාළ වන පිළිතුර තෝරන්න.
 1. සුබාරංචිය රචනා කරන ලද්දේ පේදුරුතුමාගේ ගෝලයකු විසිනි.
 2. සුබාරංචියේ සංකේතය වන්නේ සිංහයා ය.
 3. සුබාරංචිය රචනා කරන ලද්දේ වෛද්‍යවරයෙකු විසිනි.
 4. සුබාරංචියේ සංකේතය වන්නේ රාජාලියාය.

02. දූවිල්ලෙන් සැදූ මිනිසා ජීවමාන පුද්ගලයෙකු වන්නේ,
 1. දෙවියන් වහන්සේගේ සමානකමට මැවූ නිසා ය.
 2. දෙවියන් වහන්සේගේ ජීවන හුස්ම හෙලූ නිසා ය.
 3. දෙවියන් වහන්සේගේ ස්වරූපයට මැවූ නිසා ය.
 4. අන් සියලු සතුන්ව පාලනයට බලය දුන් නිසා ය.

03. ප්‍රසාද ස්නාපනයේදී භාවිතා කරන පාස්කු ඉටි පහනින් සංකේතවත් කරන්නේ,
 1. ශුද්ධාත්ම වරම් ලැබීම ය.
 2. වරප්‍රසාදිය ජීවිතයකට උත්ථාන වීමය.
 3. ක්‍රිස්තුන් වහන්සේ විසින් ආලෝක කරනු ලැබීමය.
 4. ශුද්ධාත්ම වරම් ලැබීමය.

04. අප ශුද්ධවන්තයින්ගේ ප්‍රතිමා භාවිතා කිරීමේ නිවැරදි අර්ථය වන්නේ,
 1. අපගේ යාච්ඤාවට පහසුවක් වන නිසාය.
 2. ශුද්ධවන්තයින් අපව ආශිර්වාද කරන නිසාය.
 3. ශුද්ධවන්තයින්ට අප වන්දනා නමස්කාර කරන නිසාය.
 4. එම ප්‍රතිමාවල විශේෂ බලයක් ඇති නිසාය.

05. 6 වන පනතට විරුද්ධ පාපයක් වන්නේ,
 1. අසභ්‍ය චිත්‍රපට සහ වීඩියෝ පට නැරඹීම.
 2. කේලම් කීම
 3. අන් අයගේ දේ සොරකම් කිරීම.
 4. තම වරද අන් අය මත පැටවීම.

06. අප සහභාගී වන දිව්‍ය පූජාව සම්පූර්ණවීමට කලයුතු දේ අඩංගු නිවැරදි පිළිතුර වන්නේ?
 1. යාච්ඤාවලට භක්තියෙන් සහභාගීවීමෙනි.
 2. භක්තියෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමෙනි.
 3. දිව්‍ය පූජාවේ ආරම්භයේ සිට අවසානය දක්වා එයට සහභාගී වීමෙනි.
 4. පව් වලින් තොරව දිව්‍ය පූජාවට සහභාගී වීමෙනි.



Learning Resource Ce.. R De Mazenod College Kandana

07. ස්වාමිවාක් ආරාධනාවේ අඩංගු ශාරීරික හා ආධ්‍යාත්මික අවශ්‍යතා සම්බන්ධ ඉල්ලීම තෝරන්න.
1. ඔබ වහන්සේගේ රාජ්‍ය පැමිණේවා.
2. ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා.
3. අයහපතින් අපමුදා ගත මැනව.
4. කැමැත්ත ස්වර්ගයේ මෙන් මෙලොවෙහිදීත් ඉටු වේවා.

08. නමෝ මරිය යාච්ඤාවට එළිසෙබෙත්තුමියගේ ආචාරය පදනම් කරගෙන නිර්මාණය වී ඇති කොටස තෝරන්න.
1. ''සාන්ත මරියනි දේව මෑණියනි'' කොටස.
2. ''ස්වාමීන් වහන්සේ ඔබ කෙරෙහිය'' කොටස.
3. ''නමෝ මරියනි ප්‍රිය ප්‍රසාද පූර්ණ වන්තියනි'' කොටස.
4. "ස්ත්‍රීන් අතුරින් ආශිර්වාද ලද්දී" කොටස

09. සමගි සන්දානයේ දේව ප්‍රසාද නිධානය ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද්දේ,
1. අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාවේදී.
2. පාස්කු ඉරුදින සන්ද්‍යාවේදී ගෝලයන්ට දර්ශනය වෙමින්.
3. කුරුස ගසේ මොවුන්ට සමා වුව මැනවයි කීමෙනි.
4. පේදුරුතුමන්ට සමාව දෙමින්ය.

10. දේව මාතාවන් පරලොවට වැඩි මංගල්‍යය සමරන දිනය වන්නේ,
1. ජනවාරි 01 2. දෙසැම්බර් 08 3. අගෝස්තු 15 4. සැප්තැම්බර් 08

(ලකුණු 2 x 10 = 20)

- අංක 11 - 15 දක්වා ඇති ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

11. ඉශ්‍රායෙල් ජනයා දෙවියන් වහන්සේගේම ජනතාව ලෙස ........................................ මගින් පිළිගනු ලැබුවේය.
12. අප අන් සියලු ජාතීන්ට හා ආගම්වලට අයත් අයට ගරු කළ යුත්තේ අප තුළ ඇති ........................................ නිසාය.
13. එක්වරු ශීලය අපගේ ........................................ උපකාරී වේ.
14. ................................ මගින් ශුද්ධාත්මයාණන් වහන්සේ අප වෙත වැඩම කරන සේක.
15. ................................ අප ඉරු දිනයන් හී සිහිපත් කරමු.

(පාස්කු අභිරහස, දේව සමානකමට, සිනයි ගිවිසුම, අභිවෘද්ධි ආලේපය, ආත්ම දමනයට) (ලකුණු 2 x 5 = 10)

- 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

16. දෙවියන් වහන්සේට වන්දනා ස්තුති කරන්නට යාච්ඤාව උපකාරි වේ. (..............)
17. දේව මෑණියන් බර්නදෙත් තුමියට පාතිමාහිදී දර්ශනය විය. (..............)
18. ඇස් වසා ගැනීම භාවනාවට උපකාරී වේ. (..............)
19. දෙවියන් වහන්සේ මැවූ මෙම ලෝකය අපි සංරක්ෂණය කර රැක බලා ගත යුතුය. (..............)
20. දිව්‍ය සත්ප්‍රසාද ලැබීම මගින් ප්‍රසාද නිධාන සම්පූර්ණත්වයට පත් වන්නේ ය. (..............)

(ලකුණු 2 x 5 = 10)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

01. i. යාච්ඤා වර්ග 02 නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)
ii. පොදු යැදුම් වල ප්‍රයෝජන 2ක් ලියන්න. (ලකුණු 1 x 2 = 2)
iii. ගොඩ මස් වලින් වැලකී සිටිය යුතු දිනයන් 02ක් නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)
iv. මෙරට කතෝලිකයන්ට නියමවන ණය මංගල්‍යයන් 02ක් දිනය සමග නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)
v. සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධාන 02ක් නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)
vi. රෝගීන්ගේ ආලේපය දේව ප්‍රසාද නිධානය ලබා ගත යුතු අවස්ථා 02ක් නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)
vii. ආරම්භක දේව ප්‍රසාද නිධාන 02ක් ලියන්න. (ලකුණු 1 x 2 = 2)
viii. පංච පුස්තකයට අයත් පොත් 02ක් නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)
ix. අටවන දේව පනතට අනුව පාසලේදී ඔබ කළ යුතු දෑ 2 ක් නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)
x. ජේසුස් වහන්සේ සතුරන්ට ප්‍රේම කළ ආකාරයට සතුරන්ට ප්‍රේම කළ ශුද්ධවන්තයන් දෙන්නෙක් නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)

02. i. පැරණි ගිවිසුමට අයත් පොත් 02ක් නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)
ii. නික්මයාම පොතේ අඩංගු කරුණු 03ක් ලියන්න. (ලකුණු 1 x 3 = 3)
iii. සුබාරංචි කියවීමෙන් ඔබගේ ජීවිතයට ලැබෙන ප්‍රයෝජන 05ක් ලියන්න. (ලකුණු 1 x 5 = 5)

03. i. තුන්වන දින දෙවියන් වහන්සේ මවන ලද දෑ 02ක් නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)
ii. දෙවියන් වහන්සේ ලෝකය මවා මිනිසාට පැවරූ වගකීම් 03ක් ලියන්න. (ලකුණු 1 x 3 = 3)
iii. ක්‍රිස්තුන් වහන්සේ හැදී වැඩුණු ලෙස ඔබ වර්ධනය විය යුතු ආකාරයන් 05ක් ලියන්න. (ලකුණු 1 x 5 = 5)

04. i. ප්‍රසාද ස්නාපනය හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යන දේව ප්‍රසාද නිධාන මගින් ලැබෙන වරප්‍රසාදය බැගින් ලියන්න. (ලකුණු 1 x 2 = 2)
ii. පූජා ප්‍රසාදි තුමන්ලාගෙන් ඔබට සිදුවන සේවාවන් 03ක් ලියන්න. (ලකුණු 1 x 3 = 3)
iii. පාසල් සිසුවෙකු ලෙස ඔබ මීසමේ සම්බන්ධ විය හැකි සමිති සමාගම් 02 නම් කර ඒ හරහා ඔබට කළ හැකි සේවාවන් 03ක් ලියන්න. (ලකුණු 1 x 5 = 5)

05. i. පරිසිවරයා හා අයකැමියා යන උපමාවෙන් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ 02ක් ලියන්න. (ලකුණු 1 x 2 = 2)
ii. ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 03ක් නම් කරන්න. (ලකුණු 1 x 3 = 3)
iii. යුධ ගැටුම් නිසා අසරණව සිටින දරුවන උදෙසා පැවසීමට සුදුසු යාච්ඤාවක් නිර්මාණය කර ලියන්න. (ලකුණු 1 x 5 = 5)

06. i. පළමු දේව පනතට අනුව පාසලේ දී ඔබට කළ හැකි දෑ 2 ක් සඳහන් කරන්න. (ලකුණු 1 x 2 = 2)
ii. සබත් දින ශුද්ධවන්තව ගත කිරීමට පාසල් සිසුවෙකු ලෙස ඔබට කළ හැකි දෑ 3 ක් ලියන්න. (ලකුණු 1 x 3 = 3)
iii. "4 වන දේව පනත පිළිපදිමු" යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.
(කරුණු 5 ක් ඇතුලත් විය යුතුයි) (ලකුණු 1 x 5 = 5)